සීමිත

**<u>ජාතික ගමනාගමන කොමිෂන් සභාව</u>**

**<u>ජාතික මහා මාර්ග හා අන්තර් පළාත් මගී ප්‍රවාහන බස් සේවා සැපයුම්කරුවන් තෝරාගැනීම සඳහා ඉල්ලුම්පත්‍ර කැඳවීමේ විස්තර හා ඉල්ලුම්කරුවන් සඳහා උපදෙස් (සීමිත)</u>**

## 1. <u>පසුබිම, අරමුණු හා පරමාර්ථ</u>

1.1. 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතට අනුකූලව, අන්තර් පළාත් හා ජාතික මහා මාර්ග මගී ප්‍රවාහන බස් සේවා සැලසීමේ හා නියාමනය කිරීමේ වගකීම ජාතික ගමනාගමන කොමිෂන් සභාවට පැවරී ඇත. ඒ අනුව අන්තර් පළාත් හා ජාතික මහා මාර්ග බස් සේවාවන්හි පවත්නා මගී ඉල්ලුමට සරිලන කාර්යක්ෂම, ආරක්ෂාකාරී ප්‍රමාණවත් බස් ප්‍රවාහන සේවාවක් පවත්වා ගෙන යාම සඳහා පෞද්ගලික හා රාජ්‍ය අංශයේ දායකත්වය ලබාගැනීමට කොමිෂන් සභාව විසින් ක්‍රියාකරනු ඇත.

1.2 ඒ අනුව ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් මගී සමීක්ෂණ මගින් හඳුනාගනු ලබන නව මගී බස් සේවා ආරම්භ කිරීමට හා/ හෝ පවත්නා බස් සේවාවන්හි පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා මගීසේවා අවසරපත්‍ර නිකුත් කරනු ලැබේ. එසේ නිකුත් කිරීමේදී තෝරා ගැනීමට පදනම් කර ගනු ලබන මගී සේවා අවසරපත්‍රය අවලංගු කර නව මගී සේවා අවසරපත්‍රය නිකුත් කරනු ඇත.

1.3 එම මගී අවශ්‍යතාවන්ට අනුකූලවන පරිදි සේවා සැපයීමට පෞද්ගලික අංශයෙන් ධාවකයින් තෝරා ගැනීමේදී අමාත්‍ය මණ්ඩල නිර්දේශයන්ට සහ කොමිෂන් සභාව ගෙන ඇති ප්‍රතිපත්තිමය තීරණයන්ට අනුව, ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත මත පදනම් වූ ක්‍රමවේදයක් අනුගමනය කරනු ලැබේ. ඒ අනුව කාලීනව ඇතිවන අවශ්‍යතා මත සහ ඇතිවන පුරප්පාඩු පිරවීම සඳහා වරින්වර ජාතික පුවත්පත්හි පළකරනු ලබන දැනුම්දීම් මගින් ඒ සඳහා ඉදිරිපත් වන ලෙසට දැනට මගී සේවා අවසරපත්‍රයක් හෝ පත්‍ර හිමි සහ සුදුසුකම් සහිත පුද්ගලයන්ගෙන් හෝ සමාගම්වලින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. එම නිවේදනය ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ වෙබ් අඩවියේද පළ කරනු ඇත.

1.4 දැනට ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති මගී සේවා අවසරපත්‍රයක් හිමි පුද්ගලයෙකුට මේ සඳහා ඉල්ලීම් ඉදිරිපත් කළ හැකි අතර තෝරා ගැනීමෙන් පසු ඉල්ලුම් කිරීමට පදනම් කරගන්නා මගී සේවා අවසරපත්‍රයේ අනුමත ධාවන මාර්ගය නව ඉල්ලීම් කරන ධාවන මාර්ගයට සංශෝධනය කරනු ලැබේ.

1.5 එම පුවත්පත් දැන්වීම්වලට අනුව, ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන සීමිත තරගකාරී ඉල්ලුම්පත්, එහි සඳහන් උපදෙස්වලට අනුකූලව සම්පූර්ණ කර, නියමිත දිනට හා වේලාවට ප්‍රථම ලැබෙන සේ කොමිෂන් සභාව වෙත ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ කොමිෂන් සභාවේ තබා ඇති ඉල්ලුම්පත්‍ර පෙට්ටියට දැමීම හෝ සිදුකළ යුතුය.

1.6 සුදුසුකම් ලැබූ බස් සේවා සපයන්නන්හට මගීසේවා අවසරපත් ප්‍රදානය කරන අතර ඒ සඳහා සේවා පිරිවැයක් ලෙස ජාතික ගමනාගමන කොමිෂන් සභාවට ගෙවීමක් කළ යුතුය. කෙසේ වෙතත් මගීසේවා අවසරපත්‍ර ලැබීම සඳහා සුදුසුකම් ලබනුයේ අදාළ කොන්දේසි සපුරාලන ඉල්ලුම්කරුවන් පමණි.

## 2. නිර්වචන සහ අර්ථ දැක්වීම.

2.1 ඉල්ලුම් ලේඛනවල පහත සඳහන් වචනවලට හා විස්තර කිරීම්වලට වෙනත් අන්දමේ තේරුමක් අවශ්‍යා නොවන අවස්ථාවලදී ඒ සඳහා මෙහි යෙදී ඇති අර්ථයම ගත යුතුය.

2.1.1 කොන්ත්‍රාත්තුවට අදාළ ඕනෑම ලේඛනයක සඳහන් කර ඇති නිලධරයකු දැනට එම තනතුර දරන නිලධරයා පමණක් නොව ඔහුගේ අනුප්‍රාප්තිකයාද අදහස් වන අතර, ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් එම තනතුරට අදාළ බලතල පවරා දී ඇති අනෙකුත් නිලධරයන්ද අදහස් කෙරේ.

2.1.2 මෙහි "සේවා සැපයුම්කරු" යනු කොමිෂන් සභාව විසින් අන්තර් පළාත් හා ජාතික මහා මාර්ග මගී ප්‍රවාහන බස් සේවා සැපයීම සඳහා තෝරා ගන්නා ලද ඕනෑම සමාගමක් හෝ නෛතික පුද්ගලයෙකු අදහස් කෙරේ.

2.1.3 "කොන්ත්‍රාත් ගිවිසුම" (ඉල්ලුම් කිරීමේ ලේඛන ) යනුවෙන් අදහස් කරන්නේ පහත සඳහන් ලේඛනවලින් එකක් හෝ කිහිපයක් හෝ සියලුම ලේඛන වේ.

I. මගී සේවා අවසර පත්‍රය, ඉල්ලුම්කරුවන්ට දෙනු ලබන උපදෙස්, කොන්ත්‍රාත්තුවේ කොන්දේසි, අමුණා ඇති පත්‍රිකා, ලේඛන සහ ඒ සම්බන්ධයෙන් වූ ඕනෑම සංශෝධනයක් හෝ එකතු කිරීමක් හෝ ඇමුණුමක් හෝ ඇතුළත් වේ.

II. ඉල්ලීම් ඉදිරිපත් කිරීමේ පත්‍රිකාවේ හා ඉල්ලුම් ප්‍රදානයට පෙර එහි අඩංගු කරුණු පැහැදිලි කිරීමේ ලිපි යන ලේඛනද ඇතුළත්ය.

III. ඉල්ලුම් ප්‍රදානය කිරීමේ ලිපිය

IV. කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද තාක්ෂණික ප්‍රමිතීන්

V. ඉල්ලුම් ඇපකරය,

1. මහජන බැංකුව, නාරාහේන්පිට ශාඛාවේ ජාතික ගමනාගමන කොමිෂන් සභා ගිණුමට **(ගිණුම් අංක: 119100223693155)** ඕනෑම බැංකුවක ශාඛාවකට බැර කර ලබාගත් ලදුපතක්
   හෝ
2. මහජන බැංකුව, නාරාහේන්පිට ශාඛාවේ ජාතික ගමනාගමන කොමිෂන් සභා ගිණුමට **(ගිණුම් අංක: 119100223693155) මාර්ගගත ක්‍රමයට (online) මුදල් ගෙවා සනාථ කරනලද ලේඛනයක්**
   **හෝ**
3. නියම කරන ලද මුදල් වටිනාකමකින් යුත්, ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ නමට ලියනු ලබන බැංකු අණකරයක්

ඉදිරිපත් කර ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ මුදල් අයකැමිගෙන් ලබාගත් ලදුපත.

2.1.4 **<u>"කොන්දේසි"</u>** යනුවෙන් අදහස් කරන්නේ කොන්ත්‍රාත්තුවේ ඇති කොන්දේසි වේ.

2.1.5 **<u>"පිළිගැනීමේ ලිපිය"</u>** යනුවෙන් අදහස් කරන්නේ ඉල්ලුම් ප්‍රදානය කිරීමෙන් පසු ඉල්ලුම්කරු විසින් ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත ඉල්ලුම් ප්‍රදානය පිළිගත් බවට ඉදිරිපත් කරන ලිඛිත දැන්වීම වේ.

2.1.6 "**<u>සේවා පිරිවැය</u>**" යනුවෙන් අදහස් කරන්නේ මෙකී ඉල්ලීම වෙනුවෙන් කොමිෂන් සභාව වෙත වාර්ෂිකව ගෙවිය යුතු මුදල වේ. එනම් පළමු වර්ෂයට ඉල්ලුම්කරු ගෙවීමට එකඟවන මුදල හා දෙවන වසරේ සිට කොමිෂන් සභාවේ නියමය පරිදි මගීසේවා අවසරපත්‍රය වලංගුව පවතින කාලය දක්වා වාර්ෂිකව ගෙවනු ලබන තාක්ෂණික වටිනාකම වේ.

2.1.7 **<u>"මාසයක්"</u>** යනුවෙන් ලිත් මාසයක් අදහස් වේ.

2.1.8 ඒක වචනයෙන් අදහස් කරන දේ බහු වචනයෙන්ද අදහස් කරන අතර අවශ්‍ය අවස්ථා වලදී එහි ප්‍රතිලෝමයද වේ.

2.1.9 පුරුෂලිංග වචනවලට අදාළ වචනවලින් ස්ත්‍රී ලිංගික වචනද ඇතුළත් වේ.

2.1.10 අවුරුද්ද යනු ලිත් මාස 12 ක් වේ.

2.1.11 ඉල්ලුම්කරු, අයැදුම්කරු, කොන්ත්‍රාත්කරු, මගී ප්‍රවාහන සේවා සැපයුම්කරු, ධාවකයා යන සියලුම නම් වලින් හැඳින්වෙන්නේ එකම පුද්ගලයෙකි.

**2.2 බස් සේවාවන් ලබා ගැනීමට අදහස් කරන කාල පරිච්ඡේදය**

2.2.1 පනතේ ප්‍රතිපාදන අනුව වාර්ෂිකව අලුත් කිරීමට යටත්ව මගී සේවා අවසර පත්‍රයේ කාලය දීර්ඝ කිරීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන කාලපරිච්ඡේදයක් වේ.

**2.3 ඉල්ලුම් කිරීමේ පිරිවැය**

2.3.1 ඉල්ලුම්කරු ඉල්ලීම් සකස් කිරීම හා බාර දීම සම්බන්ධයෙන් වූ සියලු වියදම් දැරිය යුතු අතර, එම වියදම් සම්බන්ධයෙන් කොමිෂන් සභාව කිසි විටකත් වගකීමක් දරනු නොලැබේ.

**3. ඉල්ලුම්කරු**

3.1 කොමිෂන් සභාව සෑහීමකට පත් වන පරිදි, සේවය කරගෙන යාමට සුදුසු බස්රථ ඉදිරිපත් කළ හැකි, ප්‍රවාහන ක්ෂේත්‍රයේ පූර්ව අත්දැකීම් ඇති පුද්ගලයෙකු හෝ නෛතික සමාගමක් වේ.

3.2 ඉල්ලුම්කරුගේ ලේඛන (ඉල්ලුම්කරු සමාගමක් නම් )

3.2.1 සමාගමක සාංගමික සංස්ථා පත්‍රය (memorandum) සහ සාංගමික ව්‍යවස්ථාවලිය (articles), හවුල් ව්‍යාපාර සම්මුතිය හෝ අදාළ වෙනත් ලේඛන.

3.2.2 සමාගම් සහතික පත්‍රය හෝ ව්‍යාපාර ලියාපදිංචි සහතික පත්‍රය හෝ අදාළ වෙනත් ලේඛන

3.3 ඉල්ලුම් කිරීම සඳහා වූ ලේඛන

3.3.1 අවශ්‍ය සේවාව, ඉල්ලුම් කිරීමේ පිළිවෙත සහ කොන්ත්‍රාත්තුවේ කොන්දේසි හා ඉල්ලුම් කැඳවීමේ නිවේදනය යනාදි කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන ලද ලේඛන මෙහි ඇතුළත්ය.

3.3.2 ඉල්ලුම්කරු, ඉල්ලුම් කිරීමේ ලේඛනවල ඇති උපදෙස්, ආකෘති පත්‍ර හා වගන්ති පරීක්ෂා කර කියවා බැලිය යුතු අතර ඉල්ලුම් කිරීමේ ලේඛනවල ඇති සියලුම තොරතුරු ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ඉල්ලීම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3.4 ඉල්ලීම් පිළිබඳ ලේඛන සම්බන්ධ පැහැදිලි කිරීම ( අවශ්‍යවන්නේ නම්)

3.4.1 ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන ඕනෑම ඉල්ලුම්කරුවෙකුට ඉල්ලුම් කරන ලේඛන සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු හෝ පැහැදිලි කිරීමක් අවශ්‍ය වන්නේ නම් ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ පහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැකිය.

අධ්‍යක්ෂ (ධාවන හා සේවා අධීක්ෂණ)
ජාතික ගමනාගමන කොමිෂන් සභාව.
241, උද්‍යාන පාර,
කොළඹ 05.
ෆැක්ස් අංකය: 0112 553 144
විද්‍යුත් තැපැල: info@ntc.gov.lk

3.4.2 සම්පූර්ණ කළ ඉල්ලුම් පත්‍ර, භාර ගන්නා අවසාන දිනයට දින 10 කට පෙර ඉදිරිපත් කරනු ලබන පැහැදිලි කිරීමේ ඉල්ලීම් පමණක් සලකා බලනු ලැබේ. මෙම ඉල්ලීම සඳහා ප්‍රතිචාර, ලිඛිතව දන්වනු ලැබේ.

**3.5 ඉල්ලුම් ලියකියවිලි සංශෝධනය කිරීම.**

3.5.1 ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කිරීමේ අවසාන දිනයට පෙර ඕනෑම වේලාවක යම් හේතුවක් නිසා කොමිෂන් සභාවට තමා විසින්ම හෝ සුදුසු ඉල්ලුම්කරුවෙකු ඉල්ලා සිටිනු ලබන පැහැදිලි කිරීමකට අනුකූලව හෝ ඉල්ලීමේ ලේඛන සංශෝධනය කොට වෙනස් කළ හැකිය.

3.5.2 මෙබඳු සංශෝධනයක් ඉල්ලුම් ලේඛනවලට ඇමුණුමක් වන අතර ඉල්ලුම් ලේඛන ලබාගෙන එමගින් ඉල්ලුම් කරන, සුදුසුකම් ලත් ඉල්ලුම්කරුවන්ට ලිපියක් මගින් හෝ ෆැක්ස් මගින් හෝ ඒ බව දන්වනු ලැබේ. ඒ අනුව කටයුතු කිරීමට ඉල්ලුම්කරුවෝ බැඳී සිටිති.

3.5.3 සංශෝධන අනුව ඉල්ලුම්පත්‍ර සකස් කිරීමට අමතර කාලය අවශ්‍ය වේ යැයි කොමිෂන් සභාව අදහස් කරන්නේ නම් ඉල්ලුම්කරුවන්ට සාධාරණ කාලයක් ලබාදීම සඳහා කොමිෂන් සභාව තම අභිමතය පරිදි ඉල්ලීම් ඉදිරිපත් කිරීමේ අවසාන දිනය දීර්ඝ කරනු ඇත.

**4. ඉල්ලුම්පත්‍ර සම්පූර්ණ කිරීම හා ඊට අදාළ උපදෙස්**

**4.1 ඉල්ලුම්පත්‍ර සමන්විත විය යුතු ලියකියවිලි**

4.1.1 නිසිලෙස සම්පූර්ණ කරන ලද පහත සඳහන් ලේඛන ලියුම්කවරයේ අඩංගු විය යුතුවේ.

1. ඉල්ලුම්පත්‍රය

2. ඉල්ලුම් ඇපකරය සඳහා මුදල් ගෙවූ රිසිට්පතෙහි මුල් පිටපත හෝ බැංකු අණකරය ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ මුදල් අයකැමිට ඉදිරිපත් කර ලබා ගත් ලදුපත

4.1.2
1. අවශ්‍ය සියලුම තොරතුරු සැපයීම සඳහා අවශ්‍ය නම් අතිරේක පිටපතක් පාවිච්චි කරන්න.
2. ඉල්ලුම්පත්‍රය සකස් කිරීමේදී ඉලක්කම් හා වචන කපා හැරීමෙන් වැළකිය යුතුවේ.
3. ඉල්ලුම්කරු ව්‍යාපාරයක් හෝ සමාගමක් නම් 3.2 හි සඳහන් ලේඛන ඉදිරිපත් කළ යුතුය.

**4.2 ඉල්ලුම්කරු තෝරා ගැනීමේ ක්‍රමවේදය**

4.2.1 හඳුනාගත් පුරප්පාඩු සහිත අන්තර් පළාත් මාර්ගවල සහ නව අන්තර් පළාත් මාර්ග සඳහා මගී සේවා අවසර පත්‍ර ලබා දීමට ඉල්ලුම්කරුවෙකු තෝරා ගැනීම ලකුණු ලබාදීමේ ක්‍රමවේදයක් යටතේ සිදු කරනු ලැබේ.

4.2.2 මෙහිදී ලබා දෙන මුළු ලකුණු සංඛ්‍යාව 100 ක් වන අතර ඉන් 90% ක් තාක්ෂණික නිර්ණායක මත ද ඉතිරි 10% පිරිවැය නිර්ණායක මත ද දෙනු ලැබේ.

4.2.3 ලකුණු ලබා දීමේ තාක්ෂණික ක්‍රමවේදය

| **නිර්ණායකය** | **ලබා දෙන උපරිම ලකුණු ප්‍රමාණය** | **ලකුණු බෙදී යාම** | **සාධාරණීකරණය** |
|---|---|---|---|
| I. ජාතික ගමනාගමන කොමිෂන් සභාව හෝ බලයලත් තැනැත්තෙකු විසින් විධිමත්ව නිකුත් කළ මගී සේවා අවසරපත්‍ර මගින් තහවුරු කළ හැකි, ටෙන්ඩරයේ අවසාන දිනය දක්වා අඛණ්ඩව මගී සේවා සැපයීමේ යෙදී සිටි කාලය (කර්මාන්තයේ අඛණ්ඩ පළපුරුද්ද) | 40 | වසරකට ලකුණු 4<br><br>දින 183 ක් සඳහා නියමිත ලකුණුවලින් 50% ක් ලබා දිය හැකිය. (උපරිම ලකුණු 40) | බස් කර්මාන්තයේ සේවා පළපුරුද්ද ඇගයීම |

<table>
<tr><td>II.ටෙන්ඩරයේ අවසන් දිනයට පූර්ව වසර 5 තුළ ඒ ඒ වර්ෂයේ ජුනි 30 දිනට ටෙන්ඩර් ඉදිරිපත් කරන්නා විසින් විධිමත් බලපත්‍ර මත මගී සේවා සැපයීමට යොදා ගනු ලැබූ බස් රථ සංඛ්‍යාව(උපරිම බස්රථ 03ක් සඳහා පමණි)</td><td>15</td><td><table><tr><td>පූර්ව වසර</td><td>උපරිම ලකුණු</td></tr><tr><td>1</td><td>5</td></tr><tr><td>2</td><td>4</td></tr><tr><td>3</td><td>3</td></tr><tr><td>4</td><td>2</td></tr><tr><td>5</td><td>1</td></tr></table></td><td>ක්ෂේත්‍රය තුළ ආයෝජනය දිරිමත් කිරීම.</td></tr>
<tr><td>III. අදාළ වර්ෂයට පෙර වර්ෂයේ ජුනි 30 දිනට හිමිව තිබූ බලපත්‍ර සංඛ්‍යාවට යම් වර්ෂයක් තුළ නව බලපත්‍ර එකතු වූයේ නම් එසේ අවසන් වරට එවැනි බලපත්‍රයක් එකතු වූ වර්ෂයේ සිට ටෙන්ඩරය අවසන් දිනට වන වසර සංඛ්‍යාව</td><td>10</td><td><table><tr><td>වසර ගණන</td><td>ලකුණු ගණන</td></tr><tr><td>5 කට වැඩි නම්</td><td>10</td></tr><tr><td>4-5 අතර නම්</td><td>8</td></tr><tr><td>3-4 අතර නම්</td><td>6</td></tr><tr><td>2-3 අතර නම්</td><td>4</td></tr><tr><td>1-2 අතර නම්</td><td>2</td></tr><tr><td>0-1 අතර නම්</td><td>0</td></tr></table></td><td>දැනටමත් බස් කර්මාන්තය තුළ සිටින ආයෝජකයින් සුරක්ෂිත කර ගනිමින් කර්මාන්තය තුළ නව ආයෝජන සඳහා ඉඩ ප්‍රස්ථා පුළුල් කිරීම.</td></tr>
<tr><td>IV. බස් රථය ලංකාවේ පළමුවරට මෝටර් රථ වාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළ දිනයේ සිට, ටෙන්ඩරයේ අවසන් දිනය වන විට වසර ගණන</td><td>12</td><td><table><tr><td>වසර ගණන</td><td>ලකුණු ගණන</td></tr><tr><td>0-6 ට අඩු</td><td>12</td></tr><tr><td>6-7</td><td>10</td></tr><tr><td>7-8</td><td>8</td></tr><tr><td>8-9</td><td>6</td></tr><tr><td>9-10</td><td>4</td></tr><tr><td>10-11</td><td>2</td></tr><tr><td>11 ට වැඩි නම්</td><td>0</td></tr></table></td><td>මගීන්ගේ ආරක්ෂාව සහ සුවපහසුව තහවුරු කරමින් නවීනතම බස්රථ සේවයේ යෙදවීම තහවුරු කිරීම.</td></tr>
<tr><td>VI. බස් රථයේ පිරිවිතරයන් මඟින් තහවුරු කළ හැකි, අඩු සංචලන හැකියාව සහිත පුද්ගලයන්ට බස් රථයට ප්‍රවේශ වීමේ පහසුකම් තිබීම</td><td>1</td><td>ඇත්නම් ලකුණු 1 ක් හිමි වේ.</td><td>විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයින්ට පහසුකම් සැලස්වීම ආදී දියුණු ප්‍රවාහන සේවාවක ලක්ෂණ දිරිමත් කිරීම.</td></tr>
<tr><td></td><td></td><td></td><td></td></tr>
<tr><td>VII. බස් රථයේ පිරිවිතරයන් මඟින් තහවුරු කළ හැකි,</td><td>12</td><td>ඇත්නම් ලකුණු 12 ක්</td><td>පරිසර හිතකාමී ප්‍රවාහන සේවාවක් දිරි ගැන්වීම.</td></tr>
</table>

| | | | |
|---|---|---|---|
| පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයකින් බස් රථය ධාවනය කළ හැකි වීම | | | |
| | | | |
| VIII. මෝටර් රථ පනතේ වරදක් බවට අධිකරණය මඟින් තහවුරු වන මාරක රිය අනතුරක් ටෙන්ඩරයේ අවසන් දිනයට පූර්ව වසර 3 තුළ සිදු නොවූ බවට අදාළ බස් රථය සම්බන්ධයෙන් බස්රථ හිමියා විසින් ලබාදෙන දිවුරුම් ප්‍රකාශය (මෙම දිවුරුම් ප්‍රකාශය අදාළ රක්ෂණ සමාගමින් තහවුරු කර ගැනීම ධාවන දෙපාර්තමේනතුව විසින් සිදුකළ යුතු ය. | -10<br>( උපරිම ලකුනු 10 ක් අඩු වේ.) | එවැනි එක් මාරාන්තික අනතුරක් සඳහා ලකුණු 5 ක් අඩු කෙරේ. | පොදු ප්‍රවාහනයේ ආරක්ෂාව පිලිබඳව වගවීම දිරි ගැන්වීම. |
| | | | |
| IX. මෝටර් රථ පනතේ වරදක් බවට අධිකරණය මඟින් තහවුරු වන අනතුරක් හේතුවෙන් යම් පුද්ගලයෙකුට වන්දි ගෙවිය යුතු ශාරීරික හානියක් හෝ දේපළ හානි සිදුව ඇති බව, ටෙන්ඩරයේ අවසන් දිනට පූර්ව වසර 3 තුළ සිදු නොවූ බවට අදාළ බස් රථය සම්බන්ධයෙන් බස්රථ හිමියා විසින් ලබාදෙන දිවුරුම් ප්‍රකාශය(මෙම දිවුරුම් ප්‍රකාශය අදාළ රක්ෂණ සමාගමින් තහවුරු | -4<br>( උපරිම ලකුනු 4 ක් අඩු වේ.) | එවැනි එක් අනතුරක් සඳහා ලකුණු 1 ක් අඩු කෙරේ | පොදු ප්‍රවාහනයේ ආරක්ෂාව පිලිබඳව වගවීම දිරි ගැන්වීම. |

| | | | |
|---|---|---|---|
| කර ගැනීම ධාවන දෙපාර්තමේන්තුව විසින් සිදුකළ යුතු ය. | | | |
| X. ටෙන්ඩරයේ අවසන් දින සිට පසුගිය වසර 3 ඇතුළත ගමනාගමන කොමිෂන් සභාව හෝ බලයලත් තැනැත්තන් විසින් තහවුරු කරන, අදාළ බලපත්‍ර කොන්දේසි හා ගිවිසුමේ කොන්දේසි උල්ලංඝනය නොකිරීම පිළිබඳ සහතිකය | -5 | එවැනි උල්ලංඝනය කිරීමක් සම්බන්ධයෙන් අදාළ ආයතනය විසින් කෙරෙන එක් තහවුරු කිරීමක් සඳහා ලකුණු 1 ක් අඩු කෙරේ | ගුණාත්මක මගී ප්‍රවාහන සේවාවක නියාමනයට අනුව කටයුතු කිරීම දිරි ගැන්වීම. |
| XI. ටෙන්ඩරයේ අවසන් දිනට පූර්ව මාර්තු 31 න් අවසන් වන දිනට පෙර වසර 3 සඳහා ආදායම් බදු ගෙවීම් සීමාව තුළ මගී සේවා සැපයීමේ ආදායම තක්සේරු ආදායම ප්රකාශ කිරීමේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සහතිකය | -3 | එවැනි සහතිකයක් මඟින් තහවුරු නොකරන එක් වසරක් සඳහා 1 ලකුණක් අඩු කෙරේ. | මගී ප්‍රවාහන සේවාව විධිමත් ආර්ථික ක්‍රියාවලියක් ලෙස හැසිරවීම දිරිමත් කිරීම. |
| XII. ටෙන්ඩරයේ අවසන් දිනට පූර්ව වසර 2 තුළ මගී සේවා සපයන බස් රථ කාර්ය මණ්ඩලයට සේවක අර්ථ සාධක අරමුදල් ප්රේෂණය කිරීම පිළිබඳ එම අරමුදල විසින් ලබා දෙන ලේඛණය | -2 | තහවුරු කර ගත නොහැකි මාස 6 ක කාලයක් සඳහා ලකුණු 0.5 ක් අඩු කෙරේ. | මගී ප්‍රවාහන සේවාවේ වෘත්තිමයභාවය ආරක්ෂා කිරීමට දිරිගැන්වීම |
| සියලුම තාක්ෂණික නිර්ණායක මත ලබා ගත හැකි උපරිම ලකුණු ගණන | 90 | | |

**4.2.4 මූල්‍යමය නිර්ණායක සඳහා ලකුණු ලබා දීම**

(අ) මූල්‍යමය නිර්ණායක සඳහා ලබා දෙන මුළු ලකුණු 10 පහත පරිදි වේ.

(ආ) සියළුම ටෙන්ඩර් මිළ ගණන්වල මධ්‍යනා‍ය (mean) ගණනය කළ යුතුය (උදා: 1000, 2000, 3000 මධ්‍යනය 6000/3= 2000).

(ඇ) ටෙන්ඩර් මිළ ගණන් 3 කට වඩා වැඩි නම් හා එම මිළ ගණන් අතර ඉහත 15 පරිදි ගණනය කළ මධ්‍යනා‍ය අගයට 100% කට වඩා වෙනස් (අඩු හෝ වැඩි) ටෙන්ඩර් මිළ ගණන් ඇත්නම්, එම ටෙන්ඩර් මිළ ගණන් ඉවත් කර ඉතිරි ටෙන්ඩර් මිළ ගණන් අනුව මධ්‍යනා‍ය ගණනය කළ යුතුය.

(ඈ) අදාළ ටෙන්ඩර් මිළ, අදාළ වන පරිදි ඉහත (ආ) හෝ (ඇ) අනුව ගණනය කළ මධ්‍යනා‍ය අගයේ ප්‍රතිශතයක් ලෙස ගණනය කර ඒ අනුව පහත වගුවේ දැක්වෙන පරිදි ලකුණු ලබා දිය යුතුය.

(ඉ) පිරිවැය නිර්ණායකය යටතේ ලකුණු ලබාදීම

| අදාළ ටෙන්ඩර් මිළ, මධ්‍යනය අගයේ ප්‍රතිශතයක් ලෙස | ලකුණු ප්‍රමාණය |
|---|---|
| 90% ට අඩු | 0 |
| 90% හෝ 91% ට අඩු | 0.5 |
| 91% හෝ 92% ට අඩු | 1.0 |
| 92% හෝ 93% ට අඩු | 1.5 |
| 93% හෝ 94% ට අඩු | 2.0 |
| 94% හෝ 95% ට අඩු | 2.5 |
| 95% හෝ 96% ට අඩු | 3.0 |
| 96% හෝ 97% ට අඩු | 3.5 |
| 97% හෝ 98% ට අඩු | 4.0 |
| 98% හෝ 99% ට අඩු | 4.5 |
| 99% හෝ 100% ට අඩු | 5.0 |
| 100% හෝ 101 ට අඩු | 5.5 |
| 101% හෝ 102 ට අඩු | 6.0 |
| 102% හෝ 103 ට අඩු | 6.5 |
| 103% හෝ 104 ට අඩු | 7.0 |
| 104% හෝ 105 ට අඩු | 7.5 |
| 105% හෝ 106 ට අඩු | 8.0 |
| 106% හෝ 107 ට අඩු | 8.5 |
| 107% හෝ 108 ට අඩු | 9.0 |
| 108% හෝ 109 ට අඩු | 9.5 |
| 109% හෝ ඊට වැඩි | 10.0 |

4.2.5 තාක්ෂණික නිර්ණායක සඳහා ලබා ගත් ලකුණු සංඛ්‍යාව හා මූල්‍යමය නිර්ණායක සඳහා ලබාගත් ලකුණු සංඛ්‍යාව එකතුකොට ඉල්ලීම ඉදිරිපත්කරන්නා ලබාගත් මුළු ලකුණු සංඛ්‍යාව ගණනය කෙරේ.

4.2.6 ලබාගත් ලකුණු අනුපිළිවෙළට (ඉහළ සිට පහළට) නිවේදනය කර ඇති මගී සේවා අවසරපත්‍ර සංඛ්‍යාවට අනුව මගී සේවා අවසරපත්‍ර නිකුත් කරනු ලැබේ.

## 4.3 ඉල්ලුම් මිල

4.3.1 අන්තර් පළාත් හා ජාතික මහා මාර්ග මගී ප්‍රවාහන බස් සේවා සැපයීමේදී පළමු අවුරුද්දට ගෙවීමට අදහස් කරන මුදල සඳහා ලංසු ඉදිරිපත් කළ යුතුය. ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරනු ලබන තාක්ෂණික අගයට වඩා ඉහළ අගයක් ඉදිරිපත් කරනු ලබන අයදුම් පත්‍ර පමණක් වලංගු වේ.

4.3.2 ඉල්ලුම්කරු විසින් ඉල්ලුම් කරනු ලබන සේවාවට, පළමු වර්ෂය සඳහා ලංසුවක් සඳහන් නොකිරීම ඉල්ලුම්පත ප්‍රතික්ෂේප කිරීමට හේතුවේ.

4.3.3 ඉල්ලුම්පත්‍ර විවෘත කිරීමෙන් අනතුරුව ඉල්ලුම්කරුවන් කවර හෝ හේතුවක් මත තම ඉල්ලුම් පත්‍රය ඉවත් කර ගැනීමකදී ඉල්ලුම් ඇපකරය ආපසු ගෙවනු නොලැබේ.

4.3.4 ඉල්ලුම්කරු විසින් එක් එක් මගී සේවා අවසරපත්‍රයක් සඳහා වෙන් වෙන් වශයෙන් ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළ යුතුය.

4.3.5 එක් ධාවන මාර්ගයක් සඳහා මගී සේවා අවසර පත්‍ර දෙකකට වඩා තිබෙන අවස්ථාවකදී ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළ හැක්කේ උපරිම ඉල්ලුම් පත්‍ර දෙකක් පමණි.

4.3.6 ඉල්ලීම ප්‍රදානය කළ දින සිට මාස 06 ක් ඇතුළත තෝරා ගනු ලබන ඉල්ලුම්කරු බස් සේවාව සැපයීමට ඉදිරිපත් නොවීම, ඉවත්වීම/ ඉවත්කිරීම හේතුවෙන් පුරප්පාඩුවක් ඇති වූ අවස්ථාවක, පිළිවෙළින් ඊළඟ වැඩිම ලකුණු ලබා ගත් සහ ඉල්ලුම් ඇපකරය ආපසු ලබා නොගත් ඉල්ලුම්කරුට, ඉල්ලීම ප්‍රදානය කිරීම කොමිෂන් සභාවේ අනුමැතිය පරිදි සිදුවේ. එවැනි අවස්ථාවක ඉල්ලුම්කරුවන් කිසිවෙක් ඉදිරිපත් නොවන්නේ නම් හෝ මාස 06 ක කාලය අවසන් වී ඇත්නම් හෝ අදාළ ඉල්ලුම්පත්‍ර කැඳවීම අවලංගු කර නැවත ඉල්ලුම්පත්‍ර කැඳවනු ලැබේ.

4.3.7 එකම ධාවන මාර්ගයක් සඳහා මගී සේවා අවසරපත්‍ර දෙකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සඳහා ඉල්ලුම්පත්‍ර කැඳවා ඇති අවස්ථාවක වැඩිම ලකුණු ලබාගන්නා ඉල්ලුම්කරුවන්ට අනුපිළිවෙළින් ඉල්ලුම් ප්‍රදානය කරනු ලැබේ.

4.3.8 තෝරා ගනු ලැබූ ඉල්ලුම්කරුවන් විසින් මගීසේවා අවසරපත්‍රය ලබා ගැනීමේදී ඔවුන් විසින් ඉදිරිපත් කරන ලද ලංසු මුදල ප්‍රථම වර්ෂය සඳහා ගෙවිය යුතු වේ. දෙවන වර්ෂයේ සිට කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන තාක්ෂණික වටිනාකම මුදලින් ගෙවිය යුතු වේ.

**ඉල්ලුම් ඇපකරය**

4.4.1 (අ) (i) මහජන බැංකුව, නාරාහේන්පිට ශාඛාවේ ජාතික ගමනාගමන කොමිෂන් සභා ගිණුමට **(ගිණුම් අංක: 119100223693155)** ඕනෑම බැංකුවක ශාඛාවකට බැර කර ලබාගත් ලදුපතක්
හෝ

(ii) මහජන බැංකුව, නාරාහේන්පිට ශාඛාවේ ජාතික ගමනාගමන කොමිෂන් සභා ගිණුමට **(ගිණුම් අංක: 119100223693155) මාර්ගගත ක්‍රමයට (online) මුදල් ගෙවා ඒ බව සනාථ කරනලද ලේඛනයක්**
**හෝ**

(iii) නියම කරන ලද මුදල් වටිනාකමකින් යුත්, ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ නමට ලියනු ලබන බැංකු අණකරයක්

ඉදිරිපත් කර ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ මුදල් අයකැමිගෙන් ලබාගත් ලදුපත

(ආ) ඉහත අවශ්‍යතාව (4.4.1 (අ) ඡේදය) සපුරා නොතිබීම ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප වීමට හේතුවක් වේ.

4.4.2 තෝරා නොගන්නා ලද ඉල්ලුම් කරුවන්ගේ ඉල්ලුම් ඇපකර ඉල්ලීම් විවෘත කළ දින සිට දින 60 ක් ඇතුළත ආපසු ගෙවනු ලැබේ. මෙම ගෙවීම් බැංකු ගිණුමකට පමණක් ගෙවන බැවින් තම බැංකු ගිණුම් අංකය ඉල්ලුම්පත්‍රයේ අංක 09 යටතේ පැහැදිලිව සටහන් කළ යුතුය.

4.4.3 ඉල්ලුම්පත්‍ර මාස 06 ක කාලයක් වලංගුව පවතින බැවින් ඉල්ලුම් ඇපකරය ආපසු ලබා ගන්නා ඉල්ලුම්කරුවන් පසු ඉල්ලුම් ප්‍රදානය සඳහා සලකා බලනු නොලැබේ.

4.4.4 තෝරා ගන්නා ලද ඉල්ලුම්කරු වෙත ඉල්ලුම පිරිනැමීම පිළිබඳ දැන්වීමෙන් පසුව එම ඉල්ලුම් ඇපකරය කාර්යසාධන ඇපකරයක් වශයෙන් රඳවා තබා ගනු ලැබේ.

4.4.5 4.5 කොන්දේසි අනුව නියමිත කාලය තුළ මගීසේවා අවසරපත්‍රය ලබාගැනීමට අපොහොසත් වන ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලුම් ඇපකරය/ කාර්යසාධන ඇපකරය ජාතික ගමනාගමන කොමිෂන් සභාවට පවරාගනු ලැබේ.

**4.4 ඉල්ලීම් ප්‍රදානය කිරීමේ ලේඛනවල වලංගු කාලය**

4.5.1 ඉල්ලීම් ප්‍රදානය කළ දිනයේ සිට මාසයක් ඇතුළත මගී සේවා අවසරපත්‍රය ලබාගත යුතුය.

4.5.2 ඉහත 4.5.1 වගන්තියෙහි සඳහන් වලංගු කාලය තවදුරටත් දින 30 ක් දීර්ඝ කිරීමට අවශ්‍ය නම් ඒ සඳහා කොමිෂන් සභාවට බලය ඇත. එවැනි දීර්ඝ කිරීමක් සඳහා ඉල්ලුම්කරු විසින් කොමිෂන් සභාව වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතුය.

**5. ඉල්ලීම් ලේඛන මුද්‍රා තබා ඉදිරිපත් කිරිම**

**5.1 ඉල්ලීම් ලේඛන මුද්‍රා තැබීම**

5.1.1 ඉල්ලුම්කරු විසින් 4.1 වගන්තියට අනුව අදාළ ලේඛන, දී ඇති ලියුම් කවරයේ බහා මුද්‍රා තැබිය යුතුය.

**5.2 ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කිරීමේ අවසාන දිනය**

5.2.1 පුවත්පත් දැන්වීම්වලට අනුව, ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන ඉල්ලුම්පත්‍ර කැඳවීම, එහි සඳහන් උපදෙස්වලට අනුකූලව සම්පූර්ණ කර, නියමිත දිනට හා වේලාවට ප්‍රථම ලැබෙන සේ කොමිෂන් සභාව වෙත ලියා පදිංචි තැපැලෙන් එවීම හෝ කොමිෂන් සභාවේ තබා ඇති ඉල්ලුම්පත්‍ර පෙට්ටියට දැමීම හෝ කළ යුතුය.

5.2.2 ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනය තම අභිමතය පරිදි දීර්ඝ කිරීමට කොමිෂන් සභාවට බලය ඇත.

**5.3 පමාවී ලැබෙන ඉල්ලුම් ලේඛන**

5.3.1 කොන්දේසි අංක 5.2 ප්‍රකාරව කොමිෂන් සභාව විසින් නියම කරන ලද දිනය හා වේලාවට පසුව ලැබෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

## 6. ඉල්ලුම්පත්‍ර විවෘත කිරීම හා විශ්ලේෂණය කිරීම.

### 6.1 ඉල්ලුම්පත්‍ර විවෘත කිරීම.

6.1.1 ඉල්ලුම්පත්‍ර භාර ගැනීමේ කාලය අවසන් වූ වහාම ලැබී ඇති ඉල්ලුම්පත්‍ර විවෘත කරනු ලැබේ.

6.1.2 මෙම ඉල්ලුම්පත්‍ර විවෘත කිරීමේ අවස්ථාවට ඉල්ලුම්කරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට සහභාගී විය හැකිය.

### 6.2 ඉල්ලුම් ලේඛන පිළිබඳ පැහැදිලි කිරීම

6.2.1 ඉල්ලුම් ලේඛන පරීක්ෂා කිරීමට, විශ්ලේෂණය කිරීමට හා සංසන්දනාත්මකව සලකා බැලීමට ආධාර කර ගැනීම සඳහා කොමිෂන් සභාව තම අභිමතය පරිදි ඉල්ලුම්කරුගෙන් ඉල්ලීම පිළිබඳව පැහැදිලි කිරීමක් ඉල්ලා සිටිය හැක. මෙකී ඉල්ලීමට පිළිතුරු ලබාදීම ලිඛිතවම කළ යුතු අතර ඉල්ලුම්පත්‍රයේ මූලික තොරතුරු හෝ මිල ගණන් වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

## 7. මූලික විශ්ලේෂණය

7.1.1 ලංසු මිල ගණන් සකස් කිරීමේදී යම්කිසි වැරදීමක් සිදුවී තිබේද යන්නත්, ලේඛන නිවැරදිව අත්සන් කර ඇද්ද යන්නත්, ඉල්ලුම්පත්‍ර ක්‍රමානුකූලව සකස් කර ඇත්ද යන්නත් තීරණය කිරීම සඳහා කොමිෂන් සභාව විසින් මූලික විශ්ලේෂණයක් කරනු ඇත.

7.1.2 ඉලක්කමෙන් ලියන ලද මිල ගණන් හා අකුරින් ලියන ලද මිල ගණන් අතර පරස්පරතාවක් පවතින අවස්ථාවකදී අකුරින් ලියන ලද මිල, ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කරනු ලබන නිවැරදි මිල ලෙස සලකනු ලැබේ.

7.1.3 සවිස්තරාත්මක ඇගයීමක් කිරීමට පෙර එක් එක් ඉල්ලුම්පත්‍ර කොන්දේසිවලට අනුකූලව සකස් කර තිබේද යන්න පරීක්ෂා කර බලනු ලැබේ.

7.1.4 කොන්දේසිවලට අනුකූලව සකස් කර නොමැති ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

### 7.2 කොමිෂන් සභාව සමඟ සම්බන්ධතා පැවැත්වීම.

7.2.1 ඉල්ලුම්පත් විවෘත කිරීමේ සිට කොන්ත්‍රාත්තුව පිරිනැමීම දක්වා කාලය තුළදී අදාළ මිල කැඳවීම සම්බන්ධව ඉල්ලුම්කරුවන් කොමිෂන් සභාව සමඟ සම්බන්ධතා පැවැත්වීම නොකළ යුතුය.

7.2.2 ඉල්ලීම් විශ්ලේෂණය කිරීම, සන්සන්දනය කිරීම හෝ කොන්ත්‍රාත්තුව පිරිනැමීම සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ තීරණවලට ඉල්ලුම්කරු විසින් යම් බලපෑමක් කිරීම ඉල්ලුම්කරුගේ ඉල්ලුම්පත්‍රය ප්‍රතික්ෂේප කිරීමට හේතුවනු ඇත.

### 7.3 ඉල්ලීමක් පිළිගැනීමට හෝ ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට කොමිෂන් සභාවට ඇති අයිතිය.

7.3.1 කොන්ත්‍රාත්තුව පිරිනැමීමට ප්‍රථම ඕනෑම අවස්ථාවක හේතු දැක්වීමකින් තොරව යම් ඉල්ලීමක් පිරිනැමීම, ප්‍රතික්ෂේප කිරීමට, ඉල්ලුම් කිරීමේ පරිපාටිය මුළුමනින්ම අවලංගු කිරීමට කොමිෂන් සභාවට අයිතිය ඇත.

## 8. පිරිනැමීමේ නිවේදනය

8.1 තෝරාගත් ඉල්ලුම්කරුවන්ට ඔවුන්ගේ ඉල්ලීම පිළිගත් බව ලිපියක් මඟින් ලියා පදිංචි තැපෑලෙන් දන්වනු ලැබේ.

**9. පිළිගැනීමේ ලේඛනය**

9.1. තෝරාගත් ඉල්ලුම්කරුවන්ට ඉල්ලීම ප්‍රදානය කිරීමේ ලිපියක් ලැබීමෙන් පසු එම ප්‍රදානය කිරීම පිළිගන්නා බව දින 07 ක් ඇතුළත ඉල්ලුම්කරු විසින් ලිඛිතව කොමිෂන් සභාවට දැනුම්දිය යුතුය.

**10. තැන්පතුව**

**10.1 තෝරාගත් කොන්ත්‍රාත්කරු වෙත ඉල්ලීම පිරිනැමීම පිළිබඳ දැන්වීමෙන් පසුව ඉල්ලුම් ඇපකරය කාර්ය සාධන ඇපකරයක් ලෙස එකගවූ කාලය සඳහා රඳවා තබා ගනු ලැබේ.**

10.1.1 මෙම ඇපකරය එකගවූ කාලපරිච්ඡේදයේ අවසානයේදී ආපසු ගෙවන අතර එකගවූ කාලයට පෙර කොමිෂන් සභාව/ කොන්ත්‍රාත්කරු විසින් එකගතාව අවසන් කිරීමක් සිදු වුවහොත් කොමිෂන් සභාවට යම් අයවීමක් ඇත්නම් එය අඩුකර ගෙන ඇපකරයේ ඉතිරි මුදල කොන්ත්‍රාත්කරුට ලබාදෙනු ඇත.

10.1.2 තැන්පතුවට අදාළ ලදුපතේ පාරිභෝගික පිටපත (Customer Copy) සුරක්ෂිතව තබාගත යුතු අතර, නියමිත අවස්ථාවේදී තැන්පතුව ලබාගැනීමට එය ඉදිරිපත් කළ යුතුය.

**11. කොන්ත්‍රාත්තුව පිළි ගැනීම**

11.1 තෝරාගත් කොන්ත්‍රාත්කරුට කොන්ත්‍රාත්තුව පිරිනැමීමේ දැන්වීමෙන් පසු දින 07 ක් තුළ ඉහත 9.1 පරිදි ඉල්ලීම් ප්‍රදානය පිළිගත් බව ලිඛිතව දැන්විය යුතු අතර ලංසු මුදල ද ගෙවිය යුතුය. ඉල්ලීම් ප්‍රදානය කළ දින සිට දින 30 ක් ඇතුළත ප්‍රදානය කළ මගී ප්‍රවාහන බස් සේවාව / සේවා ආරම්භ කළ යුතුවේ.

11. 2 මෙම දින 30 ඇතුළත බස් ප්‍රවාහන සේවාව ආරම්භ කිරීමට නොහැකිනම් කොන්ත්‍රාත්කරු විසින් එය ලිඛිතව කොමිෂන් සභාවට දැනුම් දිය යුතුවේ. සේවාව ආරම්භ කිරීම සඳහා කල් ඉල්ලීමට එමඟින් කොන්ත්‍රාත්කරුට අවස්ථාව ඇත. කෙසේ වෙතත් මෙවැනි ඉල්ලීමක් සලකා බැලීමේදී ලබා දිය හැකි අතිරේක කාලය, උපරිම දින 30 ක් පමණි.

11.3 ඉල්ලීමට අදාළ මගී සේවා අවසරපත්‍රයේ වලංගු කාලය, මගී සේවා අවසරපත්‍රය නිකුත්කරන දිනයේ සිට ආරම්භ වේ.

**12. ඉල්ලුම්කරුවන්ට විශේෂ උපදෙස්**

12.1 අත්සන් නොකරන ලද ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

12.2 ලංසු මුදල සඳහන් නොකරන ලද ඉල්ලුම්පත්‍ර සහ තාක්ෂණික අගයට වඩා අඩු ලංසු මුදලක් සඳහන් කරනලද ඉල්ලුම්පත්‍රද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

12.3 ඉල්ලුම් ඇපකරය ඉදිරිපත් නොකරන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

12.4 එක් එක් ධාවන මාර්ගය සඳහා වෙන වෙනම ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළ යුතුය.

12.5 එක් ධාවන මාර්ගයක් සඳහා මගී සේවා අවසර පත්‍ර දෙකකට වඩා තිබෙන අවස්ථාවකදී ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළ හැක්කේ උපරිම ඉල්ලුම් පත්‍ර දෙකක් පමණි

12.6 ඉල්ලුම්කරුට යැවිය යුතු සියලුම දැන්වීම් ඉල්ලුම් පත්‍රයේ සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන්, ඊ මේල්, වට්ස්ඇප් මාර්ගයෙන් (ලබාදී ඇත්නම් දුරකථන අංකයට) යවන අතර, එය ඔහුට කරන ලද ප්‍රමාණවත් දැන්වීමක් සේ සලකනු ලැබේ.

12.7 ඉල්ලුම් කිරීමේදී කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද ඉල්ලුම් පත්‍රිකා පමණක් භාවිත කළ යුතුය.

## 13. බස් සේවා සැපයුම්කරුගේ බැඳීම්

13.1 ඉල්ලුම්කරන ලද ධාවන මාර්ගයේ දෙන ලද කාලසටහනට අනුව ධාවනය කිරීම සඳහා නියම කරනු ලබන ආසන සංඛ්‍යාව හෝ ඊට වැඩි ධාරිතාවකින් යුත් සුදුසු බස්රථ සැපයීමට,

13.2 ඉල්ලීම ප්‍රදානය කළ දින සිට දින 30 ක් ඇතුළත බස් සේවා ක්‍රියාත්මක කිරීමට එකඟ වීමට,

13.3 ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අනුමත කරන ලද පිරිවිතරවලට අනුකූල, ජීපීඑස් උපකරණ සවිකර ඇති, මනා යාන්ත්‍රික යෝග්‍යතාවකින් යුක්ත, බාහිර සහ අභ්‍යන්තරව හොඳ තත්ත්වයකින් පවතින්නා වූද බස්රථ, නියමිත මාර්ගයේ ධාවනයට අනුයුක්ත කරන බවට,

13.4 කොන්ත්‍රාත්කරුගේ වියදමින් ඔමිනි බස්රථ ලියාපදිංචිය, ආදායම් බලපත්‍ර හා රක්ෂණය කිරීම වැනි රාජ්‍ය හා පළාත් පාලන නීති රීතිවලට අනුකූලවද ක්‍රියා කරන බවට හා ඒ පිළිබඳව අවශ්‍ය වන්නාවූ ලේඛන හා සටහන් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන බවට,

13.5 මෙම ඉල්ලීම් ප්‍රදානය ක්‍රියාත්මක වන කාලය තුළ, යොදවන්නා වූ බස්රථය ගැටලුවකින් තොරව ධාවනයට සුදුසු තත්ත්වයේ තිබිය යුතුවේ. සේවය සඳහා යොදවන සෑම බස්රථයක්ම කොමිෂන් සභාවේ තත්ත්ව පරීක්ෂණයට භාජනය විය යුතු වේ. තත්ත්ව පරීක්ෂණයෙන් පසුව බස්රථ ධාවනයට සුදුසු තත්ත්වයේ පවතින බවට කොමිෂන් සභාව සෑහීමකට පත් නොවන්නේ නම් එම බස් රථය ධාවනය සඳහා යෙදවීමට ඉඩදෙනු නොලැබේ. බස්රථ පරීක්ෂාව සඳහා වැයවන සියලුම වියදම් සේවා සැපයුම්කරු විසින් දැරිය යුතුවේ. කොමිෂන් සභාව කිසිදු වියදමක් සම්බන්ධයෙන් වග කියනු නොලැබේ.

13.6 බස්රථ පරීක්ෂණය කොමිෂන් සභාවේ අභිමතය පරිදි ඕනෑම වේලාවකදී, ඕනෑම නම් කරන ස්ථානයකදී සිදු කිරීමට බලය ඇති බැවින් කොමිෂන් සභාව විසින් නියම කර ඇති දිනයකදී, වේලාවකදී, ස්ථානයකදී කොන්ත්‍රාත්තුවට අදාළ බස්රථය පරික්ෂා කර බැලීම සඳහා ඉදිරිපත් කරන බවට,

13.7 හදිසි අනතුරක්/ ආපදාවක් පිළිබඳ දැනගැනීමෙන් පසු හැකිතාක් කඩිනමින් වෙනත් බස්රථයක් හෝ විකල්ප ප්‍රවාහන ක්‍රම යොදාගෙන නියමිත ගමනාන්තය දක්වා මගීන් ප්‍රවාහනය කරන බවට

13.8 ඉහත 13.7 වගන්තියේ සඳහන් කර ඇති පරිදි නියමිත කාල සීමාවක් තුළ අතිරේක ප්‍රවාහන පහසුකම් සැපයීමට අපොහොසත් වුවහොත් සියලුම මගීන් විසින් ගෙවන ලද ගාස්තු ආපසු ගෙවන බවට

13.9 බස්රථයට හෝ මගීන්ට බරපතල හදිසි අනතුරක් සිදුවුවහොත් ඒ පිළිබඳ තොරතුරු පැය 24 ක් ඇතුළත ජාතික ගමනාගමන කොමිෂන් සභාවට දන්වන බවට,

## 14. ගෙවීම

14.1 ප්‍රථම වර්ෂය සඳහා ඉල්ලුම්පත්‍රයේ සඳහන් කරනලද වාර්ෂික ලංසු මුදල ද දෙවන වර්ෂයේ සිට ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන තාක්ෂණික අගයද ගෙවිය යුතු වේ.

14.2 මගී සේවා අවසරපත්‍රය නියමිත කාල සීමාවට පෙර අවලංගු කිරීමකදී කොමිෂන් සභාවට අයවිය යුතු යම් මුදලක් වේනම් එය කාර්ය සාධන ඇපකරයෙන් අඩුකොට ඉතිරිය කොන්ත්‍රාත්කරු වෙත ආපසු ලබා දෙනු ඇත.

14.3 මගී සේවා අවසරපත්‍රයේ වලංගු කාලය අවසානයේදී පනතේ වගන්ති අනුව වසරකට නොඅඩු හා වසර තුනකට නොවැඩි කාලයක් සඳහා මෙම අවසර පත්‍රය අලුත් කිරීම සම්බන්ධයෙන් වන අවසාන තීරණය ජාතික ගමනාගමන කොමිෂන් සභාව සතු වේ.

14.4 එසේ අලුත් කිරීමට තීරණය කරන්නේ නම්, එම අලුත් කරනු ලබන කාල සීමාවට අදාළ ධාවන මාර්ගය සඳහා නියම කරනු ලබන තාක්ෂණික අගය ජාතික ගමනාගමන කොමිෂන් සභාවට ගෙවිය යුතුය.

**15. වගකීම් සහ හානිපූරණයෙන් මිදීම.**

15.1 ඉල්ලීම් ප්‍රදානයෙන් අනුමත මගී ප්‍රවාහන සේවා සැපයීමේදී සිදුවිය හැකි පාඩු, හානි හා වගකීම් සම්බන්ධයෙන් කොමිෂන් සභාව, වගකීමට නොබැඳෙන අතර, එබඳු පාඩු, හානි හා වගකීම් සඳහා තම වියදමින් හානිපූරණ රක්ෂණයක් ලබා ගැනීම සේවා සැපයුම්කරුගේ වගකීමක් වේ.

**16. රක්ෂණය**

16.1 කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන, මගීන් සඳහා අසීමිත රක්ෂණ ආවරණයක් සහ පූර්ණ හා තුන්වන පාර්ශ්වය සඳහා රක්ෂණ ආවරණයක් සියලු අවස්ථාවලදීම වලංගුව පවත්වා ගත යුතුය.

16.2 ඉහත වගන්ති 15.1 හි දැක්වෙන රක්ෂණ ආවරණ වලංගුව පවත්වා නොගැනීම කොන්දේසි උල්ලංඝනය කිරීමක් සේ සලකනු ලැබේ.

**17. මගී සේවා අවසරපත්‍රයේ වලංගු කාලය**

17.1 ඉල්ලීම් ප්‍රදානය කළ දින සිට වසරකට නොඅඩු හා වසර තුනකට නොවැඩි කාලයක් සඳහා වලංගු වේ.

17.2 පහත සඳහන් ඕනෑම එක් කාරණයක් හෝ කිහිපයක් හෝ උල්ලංඝනය කර ඇති බවට කොමිෂන් සභාව සෑහීමකට පත් වුවහොත් ඒ සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසු මගී සේවා අවසරපත්‍රය අවලංගු කිරීමට කොමිෂන් සභාවට බලය ඇත.

(අ) කොන්ත්‍රාත් ඉල්ලුම් ලේඛනවල සඳහන් එකදු වගන්තියක් අනුව හෝ ක්‍රියා නොකිරීම.

(ආ) ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත්‍රයක, වාර්තාවක, ලිඛිත තොරතුරක හෝ ලිඛිත කරුණු දැක්වීමක අසත්‍ය හෝ වැරදි සහගත හෝ තොරතුරු සපයා තිබීම,

(ඇ) ඉල්ලීම ප්‍රදානය කළ මගී ප්‍රවාහන බස් සේවාව අඛණ්ඩව හා නිසි පරිදි සැපයීමට අපොහොසත්වීම,

(ඈ) ඉල්ලීම ප්‍රදානය කළ මගී ප්‍රවාහන සේවාවට අදාළව විනය විරෝධි, නීති විරෝධි හා නීතිය හා සාමය පවත්වා ගැනීමට බාධා වන ඕනෑම කටයුත්තක් සිදු කිරීම

**18. මගීසේවා අවසරපත්‍රලාභින් සඳහා අදාළ කොන්දේසි**

***මගී සේවා අවසරපත්‍ර හිමිකරු පහත සඳහන් කොන්දේසිවලට යටත්ව මෙම මගී සේවා අවසරපත්‍රය ලබා ගන්නා බැවින් මෙම කොන්දේසි එකක් හෝ කිහිපයක් හෝ උල්ලංඝනය කර ඇති බව සනාථ වන්නේ නම් මගී සේවා අවසරපත්‍රය අවලංගු කරනු ලැබේ.***

1. මගී සේවා අවසරපත්‍රයෙන් ධාවනයට බලය දී ඇති බස් රථය ධාවනය කිරීමේ වගකීම ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය නොමැතිව වෙනත් යම් තැනැත්තෙකුට පැවරීම නොකළ යුතුය.

2. බස් රථයට ඇතුළුවන සහ නියමිත ගාස්තුව ගෙවන සියලුම මගීන් සුවපහසුවෙන් යුතුව, සුරක්ෂිතව හා නියම කර ඇති කාලය නොඉක්මවා එම මගීන්ගේ ගමනාන්තය දක්වා ප්‍රවාහනය කළ යුතුය.

3. කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන, මගීන් සඳහා අසීමිත රක්ෂණ ආවරණයක් සහ බස් රථය සඳහා පූර්ණ රක්ෂණ ආවරණයක් සියලු අවස්ථාවලදීම වලංගුව පවත්වා ගත යුතුය.

4. සෑම අවස්ථාවකදීම බස්රථය යාන්ත්‍රික වශයෙන් මනා ධාවන තත්ත්වයකින් හා පිරිසිදුව පවත්වාගෙන යා යුතු අතර බලයලත් ගරාජයකින් ලබාගත් වලංගු යෝග්‍යතා සහතිකයක් බස්රථයේ තබාගත යුතුය.

5. බස්රථය ධාවනය කරන අවස්ථාවේදී වලංගු මගී සේවා අවසරපත්‍රය බස් රථයේ රැගෙන යා යුතු අතර අවසර පත්‍ර ලේබලයේ ඡායාස්ථිත පිටපතක් බස් රථයේ ඉදිරි වීදුරුවේ වින්)ඩ්ස්ක්‍රීනයේ( ඉහළ වම් පැත්තේ ප්‍රදර්ශනය කළ යුතු ය.

6. එදිනෙදා ධාවන තොරතුරු සටහන් කිරීම සඳහා ලොග් පත්‍රයක් බස් රථයේ තබා ගත යුතුය.

7. මගී සේවා අවසර පත්‍රයේ අයිතිකරුගේ පෞද්ගලික තොරතුරුවල යම් වෙනස් කිරීමක් සිදුවුවහොත් දින තිහක් ඇතුළත එම වෙනස් කිරීම ජාතික ගමනාගමන කොමිෂන් සභාවට දැනුම් දිය යුතුය.

8. මගී සේවා අවසර පත්‍රයේ අනෙකුත් විස්තරවල කිසිදු වෙනස් කිරීමක් හෝ කිසිදු ඇතුළත් කිරීමක් හෝ සිදු නොකළ යුතුය.

9. මෝටර්රථ වාහන පනතේ විධිවිධාන, බස් රථයේ සේවකයින්ගේ සේවා නියුක්ත කිරීමට අදාළ කම්කරු නීති ඇතුළුව ශ්‍රී ලංකාවේ වලංගු අනෙකුත් නීතිවලට අනුගත විය යුතුය.

10. ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති මගී සේවා අවසරපත්‍රය, ලේබලය සහ අනෙකුත් ලේඛන ව්‍යාජ හා/හෝ කූට ලෙස සකස් කිරීම හෝ සකස් කර ඉදිරිපත් කිරීම හෝ නොකළ යුතුය.

11. ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන පිරිවිතරයන්ට අනුකූලව සෑම අවස්ථාවකම බස් රථය පවත්වා ගත යුතුය.

12. අවසර පත්‍රයෙන් අනුමත කර ඇති බස්රථය සම්බන්ධයෙන් වන ප්‍රමාද වීම, කාල සටහන අනුව යා යුතු ගමන ඇනහිටීම, බස්රථය පොලිස් අත්අඩංගුවට ගැනීම, අයිතිකරුට/ සේවක කණ්ඩායමට විරුද්ධව පොලීසිය විසින් ක්‍රියාකර තිබීම ආදී අවස්ථාවල ඒ පිළිබඳ විස්තර ජාතික ගමනාගමන කොමිෂන් සභාවට පැය 24 ක් ඇතුළත දැනුම් දියයුතු අතර යම් අලුත්වැඩියා කටයුත්තක් සඳහා දින හතකට වඩා බස්රථය ධාවනය නොකරන්නේ නම් ඒ සම්බන්ධවද ජාතික ගමනාගමන කොමිෂන් සභාවට දැනුම්දී අවසරපත්‍රය හා ලේබලය ධාවන දෙපාර්තමේන්තුවට භාරදිය යුතුය.

13. බස් රථය හා/හෝ මගීන් බරපතල හදිසි අනතුරකට පත් වුවහොත් හෝ පැය 24 ක් ඇතුළත ජාතික ගමනාගමන කොමිෂන් සභාවට ඒ බව දැන්විය යුතු අතර මාරක අනතුරක් වුවහොත් මගී සේවා අවසරපත්‍රය හා ලේබලය ධාවන දෙපාර්තමේන්තුවට වහාම භාරදිය යුතුය.

14. හදිසි අනතුරක්/ ආපදාවක් පිළිබඳ දැනගැනීමෙන් පසු හැකිතාක් කඩිනමින් වෙනත් බස්රථයක් හෝ විකල්ප ප්‍රවාහන ක්‍රම යොදාගෙන නියමිත ගමනාන්තය දක්වා මගීන් ප්‍රවාහනය කළ යුතුය. ඒ බව වහාම කොමිෂන් සභාව වෙත දැනුම්දිය යුතුය.

15. කවර හෝ හේතුවක් නිසා නියමිත ගමනාන්තයට ළඟා වීමට යම් බස් රථයක් අපොහොසත් වුවහොත් යථා පරිදි ගාස්තුව ගෙවා ඇති මගියෙකුට එසේ ගෙවන ලද සම්පූර්ණ ගාස්තුව ආපසු ගෙවිය යුතුය.

16. කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති කාලසටහනට අනුකූලව නියම කරන ලද සම්පූර්ණ ධාවන මාර්ගයේ පමණක් බස්රථය ධාවනය කරවිය යුතුය.

17. බස් රථය පිටත්වීමේ සහ ගමනාන්තයට ළඟාවීමේ අපේක්ෂිත වේලාව, මගී සේවා අවසරපත්‍ර අංකය, බස් රථයේ සේවක මණ්ඩලයේ තොරතුරු ආදිය බස්රථය ඇතුළත මගීන්ට ප්‍රකටව පෙනෙන ලෙස ප්‍රදර්ශනය කළ යුතුය.

18. ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ පූර්ව අනුමැතියකින් තොරව අවසර පත්‍රයෙන් නියම කර ඇති ධාවන මාර්ගයෙන් බැහැරව මගීන් ප්‍රවාහනය නොකළ යුතුය.

19. ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ නියෝගවලට අනුකූලව බස්රථවල ආසන වෙන් කිරීම සිදු කළ යුතුය.

20. මගී සේවා අවසර පත්‍රය කල් ඉකුත් වීමේ දිනයට මාස හයකටවත් පෙර එය අලුත් කර ගැනීමට ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතුය.

21. බස්රථය ඇතුළත සක්‍රීය හා යාවත්කාලීන කරන ලද ගිනි නිවීමේ උපකරණයක් සහ සක්‍රීය ඔරලෝසුවක් සවිකර තිබිය යුතුය.

22. බස්රථය ඇතුළත කල් ඉකුත් නොවූ ප්‍රථමාධාර උපකරණ සහ ඖෂධ අඩංගු ප්‍රථමාධාර පෙට්ටියක් සවිකර තිබිය යුතුය.

23. බස්රථය ඇතුළත මගීන්ට ක්‍රියාත්මක කිරීමට පහසු වන ලෙස යාන්ත්‍රික හෝ විද්‍යුත් සක්‍රීය සීනුවක් සවිකර තිබිය යුතුය.

24. බස් රථයේ පිටත හා ඇතුළත ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද කොමිෂන් සභාවේ ලාංඡනය අලවා තිබිය යුතුය.

25. බස්රථයේ ඇතුළත හා පිටත අනුමත කරන ලද ප්‍රදර්ශන හැර වෙනත් ලිවීම්වලින් හෝ ඇඳීම්වලින් තොර විය යුතුය.

26. ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ සහ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්ගේ පූර්ව අනුමැතියක් නොමැතිව බස් රථයේ අතිරේක සවිකිරීම් කිසිවක් සිදු නොකළ යුතුය.

27. බස්රථයේ ලියාපදිංචි සහතිකයේ සඳහන් වර්ණයෙන්ම හා/හෝ අනුමත වර්ණයෙන්ම බස්රථය තබාගත යුතු අතර මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයාගේ පූර්ව අනුමැතියකින් තොරව කිසිදු වර්ණ වෙනස් කිරීමක් සිදු නොකළ යුතුය.

28. අවසර පත්‍රය දරන තැනැත්තාගේ නම, ලිපිනය, දුරකථන අංක සහ අවසරපත්‍ර අංකය ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන ආකාරයට බස්රථයේ පසුපස රෝදය හා බස්රථයේ අවසාන කෙළවර අතර කළු පසුබිමේ සුදුපාට අකුරුවලින් පැහැදිලි ලෙස මුද්‍රණය කර හෝ ලියා තැබිය යුතුය.

29. වායුසමනය කරන ලද බස් රථවල වායුසමන තත්ත්වයන් ධාවන අවස්ථාවේදී නිසි පරිදි ක්‍රියාත්මකව තිබිය යුතුය.

30. ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන් නිකුත් කරන ලද ගමනාන්ත පුවරු බස් රථයේ ප්‍රකටව පෙනෙන පරිදි ප්‍රදර්ශනය කර තිබිය යුතුය.

31. සාමාන්‍ය සේවා නොවන අනෙකුත් සේවාවන්හි අවසර පත්‍රයෙන් අනුමත කරන ලද මගී සංඛ්‍යාව නොඉක්මවන, ආසනගත මගීන් පමණක් ප්‍රවාහනය කළ යුතුය.

32. බස් රථය ඇතුළත දර්ශන පැහැදිලිව දැකගත හැකි වන පරිදි CCTV කැමරා පද්ධතියක් සවිකර තිබිය යුතු අතර බස් රථය ධාවනය කරන සෑම විටකදීම CCTV දත්ත ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ පාලන මැදිරියට ප්‍රවේශ වීමට හැකි වන පරිදි පවත්වාගෙන යා යුතුය.

33. ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් නියම කර ඇති පිරිවිතරයන්ට අනුකූලව GPS උපකරණ සවිකර නිසියාකාරව නඩත්තු කරමින් ක්‍රියාකාරීව පවත්වාගෙන යා යුතු අතර බස් රථය ධාවනය කරන සෑම විටකදීම GPS දත්ත ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ පාලන මැදිරියට ප්‍රවේශ වීමට හැකි වන පරිදි පවත්වාගෙන යා යුතුය.

34. බස්රථය තුළ ඝෝෂාකාරී ශබ්ද නිකුත් කරන ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ සවිකිරීම නොකළ යුතුය.

35. බස්රථ සම්බන්ධයෙන් මෝටර් වාහන පනතේ නියම කර ඇති වේගසීමා, සියලු අවස්ථාවලදී පිළිපැදිය යුතු අතර අපරික්ෂාකාරී සහ නොසැලකිලිමත් ලෙස ධාවනය කිරීම හෝ ඉදිරිපස අපැහැදිලිව තිබියදී ඉස්සර කිරීම නොකළ යුතුය.

36. අධික ශබ්දයෙන් හා අනවශ්‍ය ලෙස නලා නාද කිරීම නොකළ යුතුය.

37. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද බස්රථ පැදවීම සඳහා අනුමත වලංගු රියැදුරු බලපත්‍රයක් හිමි රියැදුරන් පමණක් බස් රථයේ සේවා නියුක්ත කරවිය යුතු අතර එම රියැදුරන් ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ලියාපදිංචි වලංගු හැඳුනුම්පතක් ලබාගත් පුද්ගලයන් විය යුතුය.

38. ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ බලයලත් නිලධාරීන් විසින් බස් රථය නතර කරන ලෙසට අතින් දෙනු ලබන සංඥාවට අනුගත විය යුතු අතර ඕනෑම අවස්ථාවකදී එම නිලධාරීන් විසින් ඉල්ලා සිටින ලේඛන පරීක්ෂා කිරීමට හා අවශ්‍ය ලේඛන භාරයට ගැනීමට ඉඩ දිය යුතුය.

39. බස්රථයේ කාර්ය මණ්ඩලයෙන් හෝ මගීන්ගෙන් හෝ බස් රථයේ ගමන් ගන්නා කාන්තාවන්ට හා ළමයින්ට සිදුවිය හැකි හිංසනයන් වැළැක්වීමට අවශ්‍ය පියවර ගත යුතුය.

40. බස්රථය ධාවනය කරන අවස්ථාවලදී සුරතල් සතුන්, නීති විරෝධී/ තහනම් ද්‍රව්‍ය ප්‍රවාහනය නොකළ යුතුය.

41. බස් රථය තුළ තැපැල් හා භාණ්ඩ ප්‍රවාහනය කිරීම සම්බන්ධයෙන් ජාතික ගමනාගමන කොමිෂන් සභාව මඟින් දෙන නියෝග පිළිපැදිය යුතුය.

42. ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් නියම කරන ලද බස් ගාස්තු පමණක් මගීන්ගෙන් අය කළ යුතු අතර අදාළ ගාස්තු සටහන බස්රථය ඇතුළත මගීන්ට ප්‍රකටව පෙනෙන ලෙස ප්‍රදර්ශනය කළ යුතුය.

43. බස්රථයේ සේවක මණ්ඩලය විසින් බස්රථය තුළ දුම්පානය හා/හෝ බුලත්විට සැපීම සිදු නොකළ යුතු අතර මගීන්ද එයින් වැළැක්වීමට වගබලා ගත යුතු ය .

44. ජාතික කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන ආකෘතියට අනුව ධාවන තොරතුරු හා දත්ත නියමිත දිනට පෙර කොමිෂන් සභාවට සැපයිය යුතු අතර එම වාර්තා පිටපත් අවම වශයෙන් මාස 06 ක්වත් සුරක්ෂිතව තබා ගත යුතුය.

45. මගීන් ප්‍රවාහනය කරන අවස්ථාවලදී බස් රථය ඉන්ධන පිරවීම් සඳහා ඉන්ධන පිරවුම් ස්ථානවලට ගෙනයාම නොකළ යුතුය.

46. බස්රථය පදවන අවස්ථාවලදී රියැදුරු විසින් දුරකථන හා වෙනත් සන්නිවේදන උපකරණ පරිහරණය නොකළ යුතුය.

47. මගීන්ට අවශ්‍ය ආරක්ෂිත හා පිරිසිදු ආහාර පාන සහ සනීපාරක්ෂක පහසුකම් ලබාගත හැකි ආපනශාලාවල පමණක් බස්රථය නතර කළ යුතුය.

48. යහපත් චරිතයකින් හා මනා හැසිරීමෙන් යුතු, මගීන්ට හා මහජනතාවට කාරුණික හා විනීතව ක්‍රියාකරන, මත්පැන් හා මත්ද්‍රව්‍ය පාවිච්චි නොකරන සේවක මණ්ඩලයක් සේවයේ නියුක්ත කළ යුතුය.

49. බස්රථයේ සේවයේ නියුක්ත කරවන රියැදුරු හා කොන්දොස්තර, ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ලියාපදිංචි වී වලංගු හැඳුනුම්පත් ලබාගත් තැනැත්තන් විය යුතු අතර සේවයේ යෙදෙන අවස්ථාවලදී එම හැඳුනුම්පත පැළඳ ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් නියම කරන ලද නිල ඇඳුමින් සැරසී සිටිය යුතුය.

50. බස්රථයේ සේවා නියුක්ත කර ඇති සේවක මණ්ඩලය බස්රථය හෝ බස් පර්යන්තය තුළ ඔට්ටු ඇල්ලීම් හා සූදු ක්‍රීඩා ආදිය නොකළ යුතු අතර වෙනත් පුද්ගලයින්ටද බස් රථය තුළ එකී ක්‍රියාවන් සිදු කිරීම වැළැක්විය යුතුය.

51. ජාතික ගමනාගමන කොමිෂන් සභාව දැනුම් දීමක් සිදු කළහොත් බස් රථයේ සේවක කණ්ඩායම් පුහුණු සැසිවලට සහභාගි කරවිය යුතුය.

52. අවසරපත්‍රයෙන් අනුමත කර ඇති බස්රථ නැවතුම් ස්ථානවලදී පමණක් මගීන් සුරක්ෂිතව බස්රථයට නංවා ගැනීම හා බැස්සවීම සිදු කළ යුතුය.

53. මගී ප්‍රවාහනය කරන අවස්ථාවලදී බස්රථයේ දොරවල් වසා තැබිය යුතුය.

54. බස්රථය ඇතුළත සිඟමන් යැදීමට හා වෙළෙඳාම් කිරීමට කිසිදු තැනැත්තෙකුට අවසර හෝ අනුබල නොදිය යුතුය.

55. බස්රථය බස් මගී පර්යන්තයෙන් පිටත්වීමට පෙර කොන්දොස්තර විසින් සියලුම මගීන්ට ප්‍රවේශ පත්‍ර නිකුත්කළ යුතු අතර එහි බස්රථයේ ලියාපදිංචි අංකය, මගියාගේ ගමනාරම්භය සහ ගමනාන්තය, අදාළ දිනය හා ගාස්තුව පැහැදිලිව ලියා හෝ මුද්‍රිත අනුක්‍රමික අංකයක් සහිත වියයුතු අතර එම ප්‍රවේශ පත්‍ර පිළිබඳ වාර්තාවක් නිකුත් කරන ලද දිනයේ සිට අවම වශයෙන් මාස හයක කාලයක් සුරක්ෂිතව තබා ගත යුතුය.

56. පූජ්‍ය පක්ෂයේ, ආබාධිත තැනැත්තන්ගේ හා ගර්භනී කාන්තාවන්ගේ තනි පරිහරණය සඳහා ආසන දෙකක් බැගින් වෙන්කර තිබිය යුතු අතර එම විශේෂිත මගීන් බස්රථයේ ගමන් කරන සෑම අවස්ථාවකදීම එම ආසන ඔවුන්ගේ පරිහරණය සඳහා ලබා දිය යුතුය. එසේම බස් රථය තුළ දුම්පානය තහනම් බව දැක්වෙන දැන්වීමක්ද ප්‍රදර්ශනය කළ යුතුය.

57. ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ විශේෂ අනුමැතියකින් තොරව එක් කොන්දොස්තරවරයෙකුට වඩා සේවයේ නියුක්ත නොකළ යුතු අතර එම කොන්දොස්තර විසින් මගීන් බස්රථයට නංවාගැනීම සඳහා මහජනතාව යොමු කර ගැනීමට කෑගසා හෝ වෙනත් අන්දමින් පෙළඹවීමක් නොකළ යුතුය.

## 19. මගී සේවා අවසරපත්‍රය අවලංගු කිරීම, අත්හිටුවීම හෝ කෙටිකිරීම

19.1 ඉල්ලීම් ප්‍රදානය කරනලද ඕනෑම මගී ප්‍රවාහන බස්රථ සේවාවක් පනතේ විධිවිධාන අනුව අත්හිටුවීමට, අවලංගු කිරීමට, දීර්ඝ කිරීමට හෝ කෙටි කිරීමට කොමිෂන් සභාවට බලය ඇත. ඒ බව මගී ප්‍රවාහන සේවා සැපයුම්කරු වෙත ලිඛිතව දැනුම් දෙනු ලැබේ. අත්හිටුවීම, අවලංගු කිරීම, දීර්ඝ කිරීම හෝ කෙටි කිරීම සම්බන්ධයෙන් මගී ප්‍රවාහන සේවා සැපයුම්කරුට සිදු වන පාඩු පිළිබඳ කොමිෂන් සභාව වග කියනු නොලැබේ.

## 20. පැවරීම හා උප කොන්ත්‍රාත් කිරීම

20.1 මගී ප්‍රවාහන බස් සේවා සැපයුම්කරු හෝ ඉල්ලුම්කරු හෝ විසින්ම මෙම ඉල්ලීම් ප්‍රදානය යටතේ සැපයිය යුතු මගී ප්‍රවාහන බස් සේවාව සඳහා බැඳී සිටින අතර එම මගී ප්‍රවාහන බස් සේවා සැපයීමේ කටයුතු පැවරීම, උප කොන්ත්‍රාත් කිරීම හෝ වෙනත් කෙනෙකුට බලය පැවරීම හෝ නොකළ යුතුය.

## 21. සැපයුම්කරු හා සේවා තත්වය

21.1 මගී ප්‍රවාහන බස් සේවා සැපයුම්කරු සැම විටම නිදහස් සේවා සැපයුම්කරුවෙකු වශයෙන් සලකනු ලබන අතර කිසිදු හේතුවක් මත කොමිෂන් සභාවේ සේවකයෙකු, නියෝජිතයෙකු හෝ ඒජන්තවරයෙකු හෝ වශයෙන් නොසැලකේ.

21.2 බස් රථයේ කාර්ය මණ්ඩලය සම්බන්ධ පූර්ණ වගකීම අවසරපත්‍ර හිමිකරු සතු වේ. ඔවුන් සම්බන්ධයෙන් වලංගු කම්කරු නීතිරීති අනුව කටයුතු කළ යුතුය.

## 22. පොදු කරුණු

22.1 මගී ප්‍රවාහන බස් සේවා සැපයුම්කරු විසින් යම් කොන්දේසි කඩ කිරීමකදී හෝ ඔහු විසින් භාරගන්නා ලද වගකීමක් නිසි ලෙස ඉටු නොකිරීම සම්බන්ධයෙන් හෝ මගී ප්‍රවාහන බස් සේවා සපයන්නාට විරුද්ධව කොමිෂන් සභාව විසින් ගන්නා වූ තීරණවලදී මගී ප්‍රවාහන බස් සේවා සැපයුම්කරුට අගතියක් සිදුවන්නේ නම් ඒ සඳහා කොමිෂන් සභාව වග කියනු නොලැබේ.

22.2 මගීසේවා අවසරපත්‍රය අවලංගු කිරීමකදී හෝ කල්පිරීමකදී හෝ මගී ප්‍රවාහන බස් සේවා සැපයුම්කරුට මගී සේවා අවසරපත්‍රය පිළිබඳ කිසිදු හිමිකමක් එයින් ඉදිරියට නොලැබෙන අතර මගී සේවා අවසරපත්‍රය ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත වහාම භාරදිය යුතුවේ.

**23.** ඉහත 4.2.1 යටතේ ඉල්ලුම්කරුවෙකු තෝරා ගැනීමට නොහැකි නම් විවෘත ඉල්ලුම්පත්‍ර කැඳවීමේ ක්‍රමවේදය යටතේ ධාවකයෙකු තෝරා ගනු ලැබේ.